



# සීමාවන් පිළිබඳව කථා කරමු: සංචාරක කර්මාන්තය පුරවැසිභාවය සහ කොවිඩ් පිළිබඳව ලංකාවේ ප්‍රතිචාරය

LAW & SOCIETY TRUST

# ප්‍රජාතන්ත්‍රවාදී සංවාදය, ක්‍රියාකාරී සවන්දීම සහ පුරවැසි සහභාගිත්ව අන්තර්ගතය: වසංගත සහ සමාජ අර්බුද අවස්ථාවන්හීදී පුරවැසි සහභාගිත්වය අන්තර්ගත කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාව මුහුණපානු ලබන වසංගත සහ සමාජ- ආර්ථික අර්බුද අතරතුර පුරවැසි සහභාගිත්වය ඇති කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, නීතියේ ආධිපත්‍යය සහ මහජන වගවීම ශක්තිමත් කිරීමයි. වගකිවයුතු පුරවැසියන් ලෙස අපි
ව්‍යාවස්ථානුකූලභාවය පිළිබඳ මූලධර්ම හා බැඳුණු අර්බුදයන්ට රජය විසින් ප්‍රතිචාර දැක්වීම තහවුරු කර ගැනීමට සහ රජය විසින් විශේෂයෙන් වැරදි තොරතුරු සහ වෛරී අදහස් හුවමාරු වීම වැළැක්වීම තහවුරු කිරීමට මෙන්ම වෙනස්කම් සිදු කරන්නන්ගේ සහ බලපෑම් ඇති කරන්නන්ගේ ධනාත්මක මැදිහත්වීම තුළ සමාජ සහයෝගීතාව ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වෙමු.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, ව්‍යාපෘතිය මඟින් සෞඛ්‍යය සහ ආර්ථික අභියෝග සඳහා රජය විසින් ලබා දෙන වේගවත් ප්‍රතිචාර විශ්ලේෂණය කිරීම සඳහා නිල නොවන "පුරවැසි විමසුමක්" ස්ථාපිත කර ඇත. මෙමඟින් ප්‍රතිපත්ති ගැටලු සඳහා මහජන කථිකාවක් ප්‍රවර්ධනය කිරීම, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ලේඛනගත කිරීම; ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් වලට බලපෑම් කරන අන්දමින් පැනනඟින ගැටලු වලට පුරවැසියන්ට කාලෝචිත සහ සාධක හේතු කරගත් තොරතුරු සැපයීම සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට දැනුවත් කිරීමේ ව්‍යාපාර දියත් කිරීමට මෙන්ම පුරවැසියන් හට පශ්චාත්- වසංගත සන්දර්භය තුළ තමන්ගේ අවශ්‍යතාවන්, උද්වේගයන් සහ අපේක්ෂාවන් ගෙනහැර දැක්වීමට හැකිවන අවශ්‍යතා ඇගයීමක් දියත් කිරීමට බලාපොරොත්තු වෙයි.

මෙම වාර්තාව ව්‍යාපෘතියට දායකත්වය සැපයීමක් වශයෙන් අක්සෙල් සහ පැස්කල් බෙල් විසින් පර්යේෂණය කර/ ලියන ලදී. නීතිය හා සමාජ භාරය විසින් ඔවුන් මෙම ව්‍යාපෘතියට සම්බන්ධවීම අගය කරනු ලබයි. ලිපිය තුළ දක්වා ඇති අදහස් කිසිසේත්ම නීතිය හා සමාජ භාරයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ හෝ කළමනාකාරීත්වයේ අදහස් පිළිඹිබු නොකරයි.

## පිටකවරය නිර්මාණය: සංගීත් මදුරාවල විසිනි

# දේශ සීමා පිළිබඳ කථා කරමු: සංචාරක කර්මාන්තය, පුරවැසිභාවය සහ කොවිඩ් - ශ්‍රී ලංකාවේ ප්‍රතිචාරය

## හැඳින්වීම

කොවිඩ් 19 වසංගතය විසින් පෙර නොවූවිරූ ලෙස විනාශකාරී ආකාරයකින් දුෂ්කර තීරණ වලට මුහුණදීමට සමාජයන් තල්ලු කරමින් සිටියි. එක් අතකින් ජනතාවගේ සෞඛ්‍යය සහ සුරක්ෂිතභාවයත්, අනෙක් අතට ජනතාව ජීවත් කරවන ආර්ථිකය ආරක්ෂා කිරීමත් අතරින් ප්‍රමුඛත්වය ලබා දිය යුත්තේ කවරකටද යන අර්බුදය මේ අතරින් ප්‍රධාන වේ. අන්තර්ජාතික සංචාරක ක්ෂේත්‍රය ලොව පුරා සෞඛ්‍ය අභිලාෂයන් සහ ආර්ථික අභිලාෂයන් අතර ප්‍රධාන ම අවිනිශ්චිත ක්ෂේත්‍රයක් වී තිබේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් මිලියන තුනක් පමණ සංචාරක කර්මාන්තය මත යැපෙන අතර, එම කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයට විදේශ විනිමය උත්පාදනය කර දෙන ප්‍රධාන මූලාශ්‍රයක් ද වෙයි.

මිනිසුන් මගින් ව්‍යාප්ත වීම මෙම වසංගතයෙහි ස්වභාවය වීම හේතුවෙන් දිවයිනේ අන්තර්ජාතික පැමිණීම් අත්හිටුවීමට සිදු විය. එසේ වුවත්, අන්තර්ජාතික පැමිණීම් අත්හිටුවීමේ මෙම සෞඛ්‍යය පදනම් කරගත් අවශ්‍යතාවය ආර්ථිකයට සිදුවූ කම්පනය හේතුවෙන් ව්‍යාකූලත්වයට පත්ව සිටින විවිධ කණ්ඩායම්වල අවශ්‍යතා සමග සමබර කර ගත යුතු විය. දේශ සීමා සම්පූර්ණයෙන් ම වසා දමනු ඇත්ද, නැතහොත්, සම්පූර්ණයෙන් ම වසා නොදමා රජය විසින් කෙතරම් දුරට පැමිණීම් පාලනය කරනු ඇත්ද යන්න බහුතරයක් ශ්‍රී ලාංකිකයන් තුළ ස්වාභාවයෙන් ම පැනනැගුණු මුල් ම ප්‍රශ්නය විය. ආරම්භයේ දී සංචාරක කර්මාන්තයට මෙමගින් සිදුවන බලපෑම ප්‍රධාන ම අවධානය යොමු වූ කරුණ වුවත් අවසානයේ දී නිරෝධායනය සහ කොවිඩ් ප්‍රතිකාර සඳහා මෙරට සතු ධාරිතාවය ද දැඩි බලපෑමක් ඇති කළේය. දේශ සීමා සම්පූර්ණයෙන් ම වසා නොදැමීම සහ නිරෝධායනය සඳහා ඇති සම්පත් ප්‍රමාණය සීමා සහිත වීම නිසා රට තුළට පැමිණෙන්නන් කොවිඩ් හඳුනාගැනීමේ පරීක්ෂාවට ලක් කිරීම වෛරසය පැතිරීම පාලනය කිරීම සඳහා ඉතා වැදගත් අවශ්‍යතාවයක් විය. ඒ සමග ම, රජයේ නායකයින් සම්පූර්ණයෙන් ම රට වසාදැමිය යුතුද යන්න සලකා බලමින් සිටිය දී සහ විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් විශාල වශයෙන් නැවත පැමිණීම අධෛර්යමත් කිරීම අරමුණු කර ගත් ප්‍රකාශ සිදුකරමින් සිටිය දී එය නොතකා විදේශයන්හි වෙසෙන ඇතැම් පුරවැසියන් ආපසු පැමිණි අතර, විදේශයන්හි අතරමංව සිටි ඇතැමෙක් ආපසු පැමිණීමට මෙරට සහාය ඉල්ලමින් සිටියහ. සංචාරකයින් පැමිණීම දිගින් දිගටම සීමා කර තිබීම හේතුවෙන් සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් ද දේශ සීම මත පනවා ඇති සීමා කිරීම් ලිහිල් කරන ලෙස රජයට බලපෑම් කරමින් සිටියහ. ශ්‍රී ලංකාව කොවිඩ් වසංගතයේ මුල් වසර ගත කිරීමේ දී මුහුණ දුන්, එකිනෙකට පරස්පර වූ මෙම අවශ්‍යතා වික්ෂේපණය මෙරට දේශ සීමා ප්‍රතිපත්ති සම්බන්ධ ක්ෂේත්‍රයේ ලක්ෂණ විදහා පෙන්වයි. රජය දේශ සීමා ප්‍රතිපත්තියේ මෙම සචල අංග කළමනාකරණය කළ ආකාරය ස්වකීය කොවිඩ්-19 උපාය මාර්ගයේ (විකසනය වෙමින් පවතින) සමස්ත ප්‍රතිඵලය සඳහා සැලකිය යුතු අන්දමෙන් දායක වී ඇත.

මෙම සාකච්ඡා පත්‍රිකාව 2020 වර්ෂය තුළ දී දේශ සීමා පාලනය කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ග පිළිබඳව සමීප ලෙස විමසා බලයි. මෙම පත්‍රිකාව මෙරටට පැමිණීම් සම්බන්ධ පාලනයන් හා සීමාකිරීම්, පැමිණෙන්නන් පරීක්ෂාවට ලක්කිරීම සහ නිරෝධායනය කිරීම සඳහා වන ප්‍රවේශය, සහ නැවත සිය රටට පැමිණීමේ ගැටළුව සම්බන්ධ වර්ධනයන් පිළිබඳව සාකච්ඡා කරයි; ඉන් පසු, 2020 අග භාගයේ දී ශ්‍රී ලංකාව ස්වකීය දේශ සීමා යළි විවෘත කිරීම උදෙසා ගත් ක්‍රියාමාර්ගයෙහි ප්‍රගතිය වාර්තා කරමින්, වසංගත පාලනය කිරීමේ සමස්ත ක්‍රියාවලිය පිළිබඳ ආවර්ජනයක් තුළින් එය අවසන් කරයි.

## රට තුළට පැමිණීම් පාලනය කිරීම

2020 ජනවාරි තරම් මුල් කාලයේ දී මෙරට ජනතාව චීනයේ ඇති වූ වසංගත රෝගයක් පිළිබඳව පරික්ෂාකාරීව සිටි අතර, ශ්‍රී ලාංකිකයින් එයින් ආරක්ෂා කිරීම සඳහා රජය ගනිමින් සිටි පියවර පිළිබඳව ඔවුහු දැඩි උනන්දුවකින් පසු වූහ. මෙම අවධිය වන විට චීනය ශ්‍රී ලංකාවට සංචාරකයින්

පැමිණෙන ප්‍රමුඛතම ම රටවල් තුනෙන් එකක් විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අනුව, 2019 වර්ෂයේ දී නිවාඩු ගත කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාවෙන් 9% ක්, එනම් සංචාරකයින් 167,863 ක් චීන ජාතිකයින් වූහ. 2020 ජනවාරි මාසයේ දී පමණක් දී ශ්‍රී ලංකාවට චීන සංචාරකයින් 22,363 ක් පැමිණ ඇති අතර එය මුළු සංචාරකයින් සංඛ්‍යාවෙන් 10% ක් ලෙස ගණන් බලා ඇත.[1]

කෙසේ නමුත්, මෙම මුල් ම අවධියේ දී දේශ සීමාව මුළුමනින් ම වසා දැමීමක් පිළිබඳ සලකා බැලුවේ නැත. ජනවාරි 25 වන දින, ඒ වන විට මෙරට ගනු ලබමින් තිබූ ක්‍රියාමාර්ග පිළිබඳව එවක සෞඛ්‍යය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහජනයාව දැනුවත් කරන ලදී. ඇයගේ ප්‍රකාශයට අනුව, "පැමිණෙන සියලු ම ගුවන් මගීන් (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට) ගොඩබැසීමට පෙර ගුවන් තොටුපළ සෞඛ්‍යය කාර්යාංශය පිළිබඳව ඔවුන්ව දැනුවත් කරනු ලබයි. මගීන්ට මෙම රෝගය පිළිබඳ යම් රෝග ලක්ෂණයක් දැනෙන්නේ නම්, එම සෞඛ්‍ය කාර්යාංශයේ සිටින සෞඛ්‍යය කණ්ඩායමෙන් ඒ සඳහා අවශ්‍ය සහාය ලබා ගත හැකිය. කෙසේ නමුත්, මගීන් පර්යන්තය තුළින් ගමන් කරන විට ඔවුන්ගේ ශරීර උෂ්ණත්වය ස්වයංක්‍රීයව පරීක්ෂා කෙරෙයි. චීනයේ සිට පැමිණෙන සියලු ම මගීන් දැඩිව පරීක්ෂා කරනු ලබයි."[2]

වැඩි කලක් ගතවීමටත් පෙර, වයස අවුරුදු 43 ක් වූ චීන ජාතික කාන්තාවකට වෛරසය ආසාදනය වී ඇති බවට පරීක්ෂණ වලින් තහවුරු වීමත් සමග ශ්‍රී ලංකාවේ පළමු කොවිඩ්-19 රෝගියා වාර්තා විය.[3] මෙයට ප්‍රතිචාරයක් වශයෙන් රජය වීසා සීමා කිරීම් ක්‍රියාත්මක කරමින් චීන ජාතිකයන් මෙරටට පැමිණීම වැළැක්වීම පිණිස දේශ සීමා පාලනය කිරීම දැඩි කරන ලදී. අමාත්‍ය වන්නිආරච්චි ප්‍රකාශ කළ අන්දමට, "රජය ඊයේ දිනයේ දී (ජනවාරි 28) චීන ජාතිකයින් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සම්බන්ධයෙන් සීමාකිරීම් පැනවූයේය ... මාර්ගගතව වීසා අයදුම් කරන චීන ජාතිකයින්ට මෙරටට පැමිණි පසු ස්වයංක්‍රීයව වීසා ලබා ගැනීමේ හිමිකම තවදුරටත් නොලැබෙනු ඇත. ඒ වෙනුවට, ඔවුන් චීනයේ කුමන ප්‍රදේශයේ සිට පැමිණෙන්නේද යන්න සොයා බැලීම සඳහා ඔවුන් මාර්ගගතව ඉදිරිපත් කරනු ලබන වීසා අයදුම්පත සියුම් ලෙස පරීක්ෂා කරනු ලබන අතර, ඒ අනුව දැඩි අවදානම් ප්‍රදේශ වල සිට පැමිණෙන සංචාරකයින්ට රටට ඇතුළු වීමට අවසර දෙනු නොලැබේ."[4]

එමෙන් ම, රජය එලෙස චීන ජාතිකයින් පැමිණීම සම්බන්ධයෙන් අවේක්ෂණ ප්‍රතිපත්තියක් ද අනුගමනය කළේය. වන්නිආරච්චි ස දහන් කළ ආකාරයට, "බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට පැමිණෙන එරට සියලු වැසියන්ට චීන භාෂාවෙන් මුද්‍රණය කරන ලද පත්‍රිකාවක් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ නවාතැන් ගන්නා ස්ථාන පිළිබඳව එම පත්‍රිකාවේ සඳහන් කළ යුතුය. ඒ අනුව අදාළ ප්‍රදේශවල මහජන සෞඛ්‍යය පරීක්ෂකවරු එම සංචාරකයින් මෙරට සිටින කාලය පුරාවට ඔවුන්ව අධීක්ෂණය කරනු ඇත."[5]

පැමිණෙන මගීන් පරීක්ෂා කිරීම සඳහා විශේෂ පරිමාපකයක් ගුවන් තොටුපළෙහි ස්ථාපිත කරමින් පවතින බව ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගමේ සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ජී. ඒ. චන්ද්‍රසිරි ජනවාරි 29 වන දින පැවසුවේය. "අපි මගීන් හැරෙන්න වෙනත් කිසිවෙකුට මෙම පරිමාපකයට ඇතුල්වෙන්න ඉඩ දෙන්නෙ නැහැ. අපි පැමිණෙන සියලු දෙනාව දැඩි පරීක්ෂාවකට ලක්කරනවා... සියලු ම බලධාරීන් ඔවුන් පිළිබඳව සුපරීක්ෂාකාරීව සිටින බැවින් අනවශ්‍ය බියක් ඇති කර ගත යුතු නැහැ. අපි කොරෝනා වසංගතය පාලනය වන තුරු මෙම වැඩසටහන දිගටම පවත්වාගෙන යනවා."[6]

මාර්තු මාසයේ මුල් භාගය වන විට රජය මෙම සීමාකිරීම් ඉවත් කරන ලද බවක් පෙනෙන්නට තිබුණි. මාර්තු 6 වන දින මේජර් ජෙනරාල් ජී. ඒ. චන්ද්‍රසිරි මෙසේ පැවසුවේය, "අද සිට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංචාරකයින් සඳහා නැවත විවෘත කරනු ලබනවා ... බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ පරිශ්‍රය තුළ තමන්ට කෙතරම් හොඳින් පිරිස පාලනය කරගත හැකිද යන්න පිළිබඳව කළමනාකාරිත්වය විසින් සිදු කරන ලද අධ්‍යයනයක් මත පදනම්ව මෙම තීරණය ගෙන ඇත."[7] කෙසේ වෙතත්, ඉන් සතියකට පමණ පසුව, එනම් මාර්තු 12 වන දින, දේශීය සංචාරක මග පෙන්වන්නෙකුට සහ සහායකයෙකුට වෛරසය ආසාදනය වී ඇතැයි තහවුරු වීමත් සමග කොවිඩ්-19 ආසාදිත වූ පළමු ශ්‍රී ලාංකිකයින් හඳුනාගනු ලැබූ අතර, මෙය එතෙක් පැවති පසුබිම ක්ෂණයකින් වෙනස් වීමට හේතු විය. මාර්තු 13 වන දින, රට "නිවසේ සිට වැඩ කරන" කාල පරිච්ඡේදයක් යනුවෙන් හ ඳුන්වන ලද වසාතැබීමේ අවධියකට එළඹී අතර, රූපවාහිනිය ඔස්සේ විකාශය කරන ලද හමුවකදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ "පළමුවෙන් ම සිදු කළ යුතු වන්නේ

තවත් අය විදේශ රටවල සිට පැමිණීම වැළැක්වීමයි'' යනුවෙන් පැවසුවේය.[8] කෙසේ වෙතත්, ''රජය විසින් සිදු කරන ලද ආපදා අධ්‍යයන ක්‍රියාවලිය මගින් දැන් චීනය අඩු අවදානම් සහිත රටක් ලෙස පෙන්වා දී ඇති''[9] නිසා චීන සංචාරකයින්ගේ පැමිණීම ස ඳහා පනවා තිබූ සීමාවන් ඉවත් කරන බව ද එම හමුවේදී ම පැහැදිලි කරන ලදී. ''... සති දෙකක කාලයක් සඳහා යුරෝපීය රටවල ජනතාවට වීසා නිකුත් කිරීම අත්හිටුවන ලෙස ජනාධිපතිතුමා නිලධාරීන්ට උපදෙස් ලබාදුන්''[10] බව එයට පසු දින නිවේදනයක් නිකුත් කරමින් ජනාධිපති මාධ්‍යය ඒකකය සඳහන් කළ අතර, ඒ අනුව සිවිල් ගුවන් සේවා අධිකාරිය ''ප්‍රංශය, ජර්මනිය, ස්පාඤ්ඤය, ස්වීඩනය, ස්විට්සර්ලන්තය, නෙදර්ලන්තය සහ ඕස්ට්‍රේලියාව''[11] යන රටවල සිට මගීන් පැමිණීම අත්හිටවූයේය.

යථානුරූපී නොවූ පළමු අගුළු දැමීමේ සතිය ගෙවීයාමත් සමග, දේශ සීමා වසා දැමිය යුතුද යන ප්‍රශ්නය පිළිබඳ උනන්දුව තවත් වැඩි විය. ඇත්ත වශයෙන් ම, මාර්තු 17 වන විට, ගුවන් තොටුපළ වසා දැමිය යුතු යැයි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ජනාධිපතිවරයාට නිර්දේශ කර තිබුණි.[12] අනෙක් අතට, ''මේ අවස්ථාවේ දී ගුවන් තොටුපළ මෙහෙයුම් නවතාලීමේ කිසිදු අවශ්‍යතාවක් නැහැ. අපි ගුවන් තොටුපළ පරිශ්‍රය තුළ කොවිඩ්-19 පැතිරීම පාලනය කිරීම සඳහා ඉතා පරීක්ෂාකාරීව පියවර ගෙන ඇති බැවින් මේ වන තෙක් අපිට එය හොඳින් කළමනාකරණය කර ගැනීමට හැකිවී තිබෙනවා'' යනුවෙන් ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගමේ සභාපති මේජර් ජෙනරාල් චන්ද්‍රසිරි මහතා පැවසුවේය.[13]

කෙසේ වෙතත්, වහාම ක්‍රියාත්මක වන පරිදි ගුවන් තොටුපළ වසා දමන බව එයට පසු දින ජනාධිපති රාජපක්ෂ ප්‍රකාශයට පත් කළේය. රූපවාහිනිය ඔස්සේ විකාශය වූ හමුවකදී ඔහු මෙම කරුණ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා නොකළ යුතුය යන දැඩි ස්ථාවරයක සිටින බවක් පෙනෙන්නට තිබුණි.[14] මෙරටට ආපසු පැමිණි, පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය මගහැර සිටි පුද්ගලයින් හා ඔවුන්ගේ ආශ්‍රිතයින් නිසා රෝගය සම්ප්‍රේෂණය වූ බව සහ ඔවුන් හඳුනා ගෙන ඔවුන්ව නිරෝධායනයට යොමු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු බව ඔහු පැහැදිලි කළේය. විදේශයන්හි සිටින නැවත සිය රටට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටින ශ්‍රී ලාංකිකයන් පිළිබඳව ප්‍රශ්න කළ විට ජනාධිපතිවරයා ස්ථිර වශයෙන් ම ප්‍රකාශ කළේ පැමිණීම් සැලකිය යුතු ලෙස ඉහළ ගිය හොත් මෙම ක්‍රියාවලිය යටපත් වනු ඇති බව ය. එසේ හෙයින්, රටවල් 15 ක් (ප්‍රධාන වශයෙන් ම යුරෝපීය රටවල්) ආවරණය වන පරිදි සංචාරක සීමා දීර්ඝ කරන ලදී.[15] ඉන් සතියක් ඇතුළත, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විද්‍යුත් වීසා ලබා ගෙන ඇති, එහෙත් ඒ වන විටත් ශ්‍රී ලංකාවට පැමිණ නොමැති සියලු ම විදේශිකයින්ට ලබාදී තිබූ සියලු ආකාරවල විද්‍යුත් වීසා අත්හිටවූයේය.[16] එයින් දින දෙකකට පසුව, ජනාධිපති මාධ්‍යය ඒකකය ''කොවිඩ්-19 වෛරස් තත්ත්වය අවම වන තුරු දැනට තමන් සිටින ස්ථාන වල සුරක්ෂිතව රැඳී සිටින ලෙස'' විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයින් ගෙන් ඉල්ලා ප්‍රකාශයක් නිකුත් කළේය.[17] ''විදේශයන්හි සිටින ශ්‍රී ලාංකික සිසුන්, ව්‍යාපාරිකයින්, සහ රැකියාවල නියුතුවූවන් ආපසු පැමිණීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් මෙරට රෝගය පැතිරීම පාලනය කළ පසු සලකා බලනු ලබන බව''[18] ද එම ප්‍රකාශයේ වැඩිදුරටත් සඳහන් විය. වීසා අත්හිටුවීම මාර්තු 31 මධ්‍යම රාත්‍රිය දක්වා බලපැවැත්වීමට නියමිතව තිබුණ ද, පසුව ය අප්‍රේල් 7 වන දා දක්වා දීර්ඝ කරන ලදී.[19] එම සතියේදී ම, ආගමන විගමන දෙපාර්තමේන්තුව සියලු ම විදේශිකයින්ට අලුතින් නිකුත් කිරීම ද අත්හිටුවන ලදී.[20]

## මෙරටට පැමිණෙන්නන් පරීක්ෂා කිරීම සහ නිරෝධායනය කිරීම

විශේෂයෙන් ම, දේශ සීමා සම්පූර්ණයෙන් ම වසා දමන තෙක් ම, පැමිණෙන සංචාරකයන් මගින් වෛරසය රට තුළ ව්‍යාප්ත වීම වැළැක්වීම වැදගත් විය. කෙසේ වෙතත්, ආපසු බැලීමේදී, රට තුළට පැමිණෙන්නන් කොවිඩ් පරීක්ෂාවට ලක්කිරීම සඳහා රජය අනුගමනය කළ ප්‍රතිපත්ති ඇතැම් විට විමතියට හේතු විය.

මුල් කාලයේ, ජනවාරි මාසයේදී, පැමිණෙන්නන් පරීක්ෂාකිරීම අතිශය ලිහිල්ව සිදුවූ බව දක්නට ලැබුණි. ගුවන් තොටුපළේ සෞඛ්‍ය කාර්යාංශයක් ස්ථාපන කරන ලද අතර, මගීන්ට කොවිඩ් ආසාදනය වීමේ යම් ලක්ෂණක් දැනුණ හොත් මෙම සෞඛ්‍යය කාර්යාංශයේ සහාය ලබාගත හැකි බව ගුවන් තොටුපළට ගොඩ බැසීමට පෙර මගීන්ව දැනුවත් කරන ලදී. ඒ සමග ම, මගීන් පර්යන්තය තුළින් ගමන් අතරතුර ඔවුන්ගේ ශරීර උෂ්ණත්වය ස්වයංක්‍රීයව පරීක්ෂා කරන ලද අතර, චීනයේ සිට පැමිණෙන මගීන් දැඩි ''පරීක්ෂාවට'' ලක් කරන ලදී.[21] චීනයේ සිටි ශ්‍රී ලාංකික සිසුන් පැමිණීම ආරම්භ

වූ විට, "නිතිපතා සෞඛ්‍යය පරීක්ෂාවන්ට සහභාගී වන ලෙස සහ සිය ශරීර උෂ්ණත්වය පිළිබඳව සැලකිලිමත්ව සිටින ලෙස ඔවුන්ගෙනේ ඉල්ලා සිටින ලදී. තවද, අවම වශයනේ දින 20 ක් වත් මුහුණු ආවරණ පැළඳ සිටින ලෙස ද ඔවුන්ගෙන් ඉල්ලා සිටින ලදී."[22] කෙසේ වෙතත්, වූහාන් වල ඉගෙනුම ලබමින් සිටි සිසුන් 33 දෙනෙක් මෙරටට ගෙන්වා ගැනීම සඳහා රජය ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමග එක්ව මහත් ප්‍රචාරයක් ලබා දෙමින් 'ගලවා ගැනීමේ මෙහෙයුමක්' දියත් කළ අවස්ථාවේදී රජය විශේෂයෙන් එම සිසුන්ව දියතලාව යුධ හමුදා කඳවුරේ නිරෝධායනය කරවීමට පියවර ගත්තේය.[23] මෙලෙස, වෛරසය සම්ප්‍රේෂණය වීම වැළැක්වීම සඳහා නිරෝධායනය වීමේ අවශ්‍යතාව ජනවාරි තරම් මුල් කාලයේදී පවා රජය දැන සිටි නමුත්, චීනයේ සිට පැමිණෙන්නන් සම්බන්ධයෙන්වත් එය අනුගමනය කිරීමට කටයුතු නොකළේ ය. තවද, රෝග ලක්ෂණ රහිත රෝගීන් පරීක්ෂා කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොතිබූ බැවින් එවැනි රෝගීන් සිටීමේ හැකියාව පිළිබඳව රජය දැනුවත්ව නොසිටි බවක් පෙනී යයි. 2020 ජූනි මාසය වන තෙක් ම ශ්‍රී ලංකාව විදෙස් රටවල සිට පැමිණෙන්නන් පී.සී.ආර්. පරීක්ෂණ යොදා ගනිමින් පරීක්ෂා කිරීම නිල වශයෙන් ආරම්භ කර නොතිබුණි.[24]

විදෙස් රටවල සිට පැමිණෙන්නන් නිරෝධායනය කිරීම සලකා බැලීමේදී ද රජය ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට අපොහොසත් වී ඇති බව පෙනී යයි. මාර්තු 1 වැනි දා සිට 9 වැනිදා අතර කාලයේ දී ශ්‍රී ලාංකිකයින් 8,507 දෙනෙක් නැවත ශ්‍රී ලංකාවට පැමිණියහ; ඔවුන්ව ඍජුව ම නිරෝධායනට යොමු කරනවා වෙනුවට ඔවුන්ට තම ප්‍රදේශයේ පොලිස් ස්ථානය සහ සෞඛ්‍යය නිලධාරින් වෙත ගොස් ලියාපදිංචි වී, තමන් විසින්ම "ස්වයං-නිරෝධායනයට" ලක් වන ලෙසට ඔවුන්ට දැනුම් දෙන ලදී.[25]

ආරම්භයේ දී මහජනතාව නිරෝධායනය වීමට බියෙන් පසුවිය. රජය විදේශයන්හි සිට මෙරටට පැමිණි පුද්ගලයින් සංඛ්‍යාව දැන සිටියත්, අදාළ ප්‍රදේශවල ලියාපදිංචි වී සිටි සංඛ්‍යාව හා විදේශයන්හි සිට පැමිණි සංඛ්‍යාව සමාන නොවීය. විවිධ රජයේ නිලධාරීන් මාධ්‍යය හරහා නිරෝධායන වීමේ වැදගත්කම අවධාරණය කරනු දක්නට ලැබුණ අතර, සෞඛ්‍යය අධිකාරින් වෙත සිය රෝග ලක්ෂණ අනාවරණය නොකළ විදේශයක සිට පැමිණි පුද්ගලයෙකුට විරුද්ධව නඩු පැවරීමට පවා තමන් නියෝග කළ බව ජනාධිපති රාජපක්ෂ පැවසීය.[26] ඒ සමගම, ප්‍රාදේශීය ප්‍රජාවන් තම ප්‍රදේශයන්හි නිරෝධායන මධ්‍යස්ථාන පිහිටුවීමට එරෙහිව විරෝධය දැක්වූහ. මාර්තු මස මුල් භාගයේදී හැඳල ලාදුරු රෝහල නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස යොදා ගන්නා බව නිවේදනය කළ අවස්ථාවේ දී[27] ඒ අවට පදිංචි ජනතාව එයට විරෝධය පළ කළ අවස්ථාව මෙය පළමුවෙන් ම දැකගත හැකි වූ උදාහරණය වූයේ අතර, එම ආරවුල සමථයකට පත්කිරීමට දේශපාලන මැදිහත්වීම් පවා අවශ්‍ය විය.

ස්වයං නිරෝධායනය අපේක්ෂා කළ ආකාරයට සමාන අන්දමෙන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන්, රජය මාර්තු 10 වන දින දකුණු කොරියාව, ඉතාලිය සහ ඉරානයේ සිට පැමිණෙන සියල්ලන්ට නිරෝධායනය වීම අනිවාර්ය බව නිවේදනය කළ අතර, දින 14 ක කාලයක් ස්වයං නිරෝධායනය වන ලෙසට අනෙක් රටවල සිට පැමිණෙන්නන් ගෙන් ද ඉල්ලා සිටියේය.[28] මේ අනුව, එම විශේෂිතව සඳහන් කරන ලද රටවල සිට පැමිණෙන පිරිස් නිරෝධානය කිරීම සඳහා හමුදා නිලධාරින් විසින් ගුවන් තොටුපළේ සිට කන්දකාඩු, පූනානි සහ දියතලාව යන හමුදා කඳවුරු වල පිහිටුවා ඇති නිරෝධායන මධ්‍යස්ථාන තුන වෙත රැගෙන යන ලදී. මේ අතරතුර හමුදාව තවත් නිරෝධායන මධ්‍යස්ථාන සකස් කිරීමෙහි ද නිරත විය.

එයට පසු දින සිට ම, නිරෝධායන මධ්‍යස්ථානවල ඇති පහසුකම් සම්බන්ධයෙන් එල්ල වන විවේචන සමාජ මාධ්‍යය හරහා දැකගත හැකි විය. මාධ්‍ය අමතමින් සෞඛ්‍යය ඇමතිනී පවිත්‍රා වන්නිආරච්චි මෙම විවේචන ප්‍රතික්ෂේප කළ අතර, අන්තර්ජාලයේ වැරදි ප්‍රවෘත්ති පළ නොකරන ලෙස ද ඉල්ලා සිටියාය. "ඇතැම්විට මෙරටට පැමිණෙන්නන් පවතින අවදානම් තත්ත්වය පිළිබඳව නොදැනුවත්ව සිටිනවා හෝ, නැත හොත් එය ඔවුන්ගේ ආත්මාර්ථකාමීකම හෝ විය හැක; එහෙත් රටේ සෞඛ්‍යය ඇමති වශයෙන් මට විශේෂයෙන් ම රටේ ජීවත් වන ජනතාව කෙරෙහි වගකීමක් තිබෙනවා; එනම් ඔවුන් ආරක්ෂා කිරීමේ සහ රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමේ වගකීම තිබෙනවා" යනුවෙන් ප්‍රකාශ කළාය.[29]

සෞඛ්‍ය ඇමතිවරිය මෙලෙස රෝගය වැළැක්වීමේ අවශ්‍යතාව දැඩි ලෙස අවධාරණය කළ ද, ශ්‍රී ලංකාව මුලදී නිරෝධායනය කළේ දකුණු කොරියාව, ඉතාලිය සහ ඉරානයේ සිට පැමිණි පුද්ගලයින් පමණි. සැබවින් ම, මෙම අවධියේ දී චීනයේ සිට පැමිණි පිරිස් නිරෝධායනයට නොයැවීම පුදුමයට කරුණකි. රජය විසින් අනුගමනය කරනු ලබන අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියට අනුව චීනය

අඩු අවදානම් රටක් ලෙස පෙන්නුම් කරන බව මෙම තීරණය සම්බන්ධයෙන් ප්‍රශ්න කළ අවස්ථාවේ දී වෛද්‍ය අනිල් ජාසිංහ පැවසුවේය.[30] එයට පසු දින, යුරෝපයේ සිට පැමිණෙන සියලුම දෙනා අනිවාර්ය නිරෝධායනයට ලක්විය යුතු බව ප්‍රකාශ කරන ලදී.[31]

"ඉහළ අවදානම්" සහිත රටවල සිට පැමිණෙන්නන් අනිවාර්යයෙන් නිරෝධායනට ලක්විය යුතු වුවත්, ඇතැමෙක් එම ක්‍රියාවලිය මගහැර සිටීමට සමත් විය. ඇත්ත වශයෙන්ම, එලෙස ආපසු පැමිණ නිරෝධායනය මගහැර සිටින්නන් සොයා ඔවුන්ව නිරෝධායනයට යොමු කරන ලෙස මාර්තු 18 වන දින ජනාධිපති රාජපක්ෂ පොලිසියෙන්, හමුදාවෙන්, මහජන සෞඛ්‍යය පරික්ෂකවරුන්ගෙන් සහ ග්‍රාම නිලධාරීවරුන්ගෙනග් ඉල්ලා සිටියේය.[32] අඩු තරමින් මුල් අවධියේ දී හෝ හමුදාව විසින් විදේශ රටවල සිට පැමිණි පුද්ගලයින් ව ගුවන් තොටුපළේ සිට නිරෝධායන මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කර ඔවුන්ට නිරෝධායන පහසුකම් සපයා දුන් අවස්ථාවේ පවා ඔවුන් එය මගහැර සිටි බව සැලකිල්ලට ගත යුතු කරුණකි. තවද, පරිපාලනය මේ සම්බන්ධයෙන් අප්‍රසාදය පළකර ප්‍රතිචාර දක්වමින්, නිරෝධානය මගහැර සිටි පුද්ගලයින්ට නිරෝධායන වීමට බල කර සිටිය ද, එය විදේශයන්හි සිට පැමිණෙන පුද්ගලයින් තුළ නිරෝධායන ක්‍රියාවලිය සුරක්ෂිත සහ ඵලදායක වන්නේය යන්න පිළිබඳ පැහැදීමක් සහ විශ්වාසයක් ගොඩනැඟීමට අපොහොසත් වී ඇති බව එයින් පෙනී යයි. සැබවින් ම, අප්‍රේල් මාසය තරම් පසු කාලයේ දී පවා, ඉන්දියාව, ඉන්දුනීසියාව සහ ඩුබායි වැනි රටවල සිට පැමිණ නිසි පරිදි නිරෝධායනය නොවූවන් ආශ්‍රිතව වෛරසය ආසාදනය වූවන් වාර්තා වෙමින් තිබුණි.[33] තවත් කෙටි කලකින්, එයටත් වඩා වැඩි පිරිසක් විදේශයන්හි සිට මෙරටට පැමිණි අතර, ඔවුන්ව නිසි පරිදි නිරෝධායනය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ඔවුන් මගින් රෝගය ව්‍යාප්ත වීම ආසාදිතයින් සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ යාමට ප්‍රධාන හේතුවක් විය.[34]

## නැවත සිය රට පැමිණීම

මෙතෙක් සාකච්ඡා කළ කරුණු වලින් පැහැදිලි වන පරිදි, දේශසීමා ප්‍රතිපත්තිය සංදර්භය තුළ ඉස්මතු වන ප්‍රධාන මාතෘකාවක් වන්නේ විදේශගතවී සිටි පුද්ගලයින් නැවත සිය රට පැමිණීමේ ගැටළුවයි. වසංගතය ලෝකය පුරා පැතිර යාමත් සමග, විදෙස් රටවල ජීවත්ව සිටි ශ්‍රී ලාංකිකයන් විශාල වශයෙන් නැවත මෙරටට පැමිණෙන්නට පටන් ගත්හ. විදේශ රටවල රැකියා අවස්ථා අහිමි වීම ඔවුන් එසේ පැමිණීමට බලපෑ ප්‍රධානතම හේතුව වූ අතර, ඔවුන් ජීවත්ව සිටි ප්‍රදේශවල වසංගත තත්ත්වයෙහි පැවති උග්‍ර බව ද ආපසු මෙරටට පැමිණීමට ඔවුන්ව පෙළඹවූ තවත් කරුණක් විය. විශේෂයෙන් ම රෝගීන් සංඛ්‍යාව වැඩිවෙමින් පැවති සහ නිරෝධායනය කිරීමට සිදුවන පුද්ගලයින් සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යමින් පැවති තත්ත්වයක් තුළ සෞඛ්‍ය පද්ධතියෙහි පැවති ධාරිතාවය සැලකිල්ලට ගැනීමේ දී, විදෙස් රටවල සිටි පුද්ගලයින් නැවත මෙරටට පැමිණීම මෙරට සිටි ශ්‍රී ලාංකිකයින්ට අභියෝගයක් එල්ල කළේය.

කෙසේ වෙතත්, නැවත සිය රට පැමිණීමේ මුල් කාලය වූ පෙබරවාරි මාසයේ දී, රජය මේ සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් දැක්වූයේය. චීනයේ අනෙකුත් ප්‍රදේශ වල සිටි සිසුන් ඔවුන් විසින් ම මෙරටට පැමිණි අතර, වසංගතයේ කේන්ද්‍රස්ථානය වූ වූහාන් ප්‍රදේශයේ සිරවී සිටි ශ්‍රී ලාංකික සිසුන් නැවත ගෙන්වා ගැනීමට රජය "අනුග්‍රහය දැක්වීමේ මෙහෙයුමක්" දියත් කළේය.[35] එහෙත්, ඒ වහාම රජය නැවත පැමිණෙන්නන් අධෛර්යමත් කිරීමට ද පටන් ගත්තේය. මාර්තු මාසයේ මැදභාගයේ දී, නිරෝධායන ධාරිතාව හේතුව ලෙස දක්වමින්, මෙරටට පැමිණීම් සම්පූර්ණයෙන් ම නවතා දැමිය යුතු යැයි ජනාධිපතිවරයා ස්ථිර ලෙස කියා සිටියේය.[36] ඒ අනුව, මාර්තු මාසය අවසානය වන විට, ගුවන් තොටුපළෙහි සියලු ම පැමිණීම් අත්හිටුවන ලද අතර, විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන්ට ඔවුන් සිටින තැන්වල ම සිටින ලෙසට ජනාධිපති මාධ්‍ය ඒකකය උපදෙස් දුන්නේය.[37] කෙසේ වෙතත්, එම අවස්ථාවේ විශේෂ හේතූන් මත පුද්ගලයින් නැවත මෙරටට ගෙන්වා ගත් අවස්ථා කිහිපයක් ද ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඉන්දියාවේ සංචාරය කරමින් සිටි වන්දනාකරුවන් 48 දෙනෙක්[38] මෙන්ම ඉන්දියාව[39] සහ නේපාලය[40] වැනි රටවල් ගණනාවක අධ්‍යාපනය ලබමින් සිටි ශ්‍රී ලාංකික සිසුන් ද නැවත ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීම එයට උදාහරණය ලෙස දැක්විය හැක. අනෙකුත් රටවල සිටින සිසුන් ද නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට ඉල්ලීම් කළහ: බෙලරුස් රාජ්‍යයේ සිටි සිසුන් 850 දෙනෙක් මෙන්ම බංගලාදේශය වැනි රටවල[41] සිටි සිසුන් ද ආපසු පැමිණීමට පහසුකම් සලසන මෙන් ජනාධිපතිතුමාට ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කළහ. ඇත්ත වශයෙන් ම, රජය ඔවුන් නැවත මෙරටට පැමිණීම අධෛර්යමත් කර තිබුණ ද, ශ්‍රී ලාංකිකයන්ට විදේශයන්හි සිට නැවත පැමිණීම සඳහා රජයේ

සහාය ඉල්ලා සිටීමට ‘ශ්‍රී ලංකාව අමතන්න’ (Contact Sri Lanka) නම් වූ මාර්ගගත පිවිසුමක් ද දියත් කළේය. මැයි මස අවසානය වන විට, පුද්ගලයින් 42,522 දෙනෙක් නැවත මෙරටට පැමිණීමට මෙම වෙබ් අඩවියෙහි ලියාපදිංචි වී සිටියහ.

වැදගත් කරුණක් වන්නේ, බංගලාදේශයේ සිටි ශ්‍රී ලාංකිකයන්ගෙන් ලැබුණු ඉල්ලීමේදී, ඔවුන් “ඔවුන්ගේ ගුවන් ටිකට්පත් සඳහා ගෙවීම් කරන්නේ කෙසේද යන්න සහ මෙරටට පැමිණි පසු නිරෝධායනය වන්නේ කෙසේද” යන්න පිළිබඳව විශේෂයෙන් ම සඳහන් කර තිබීමයි.[42] නිරෝධායන මධ්‍යස්ථාන සඳහා කිසිදු ගාස්තුවක් අයනොකරන බව ආරම්භයේදී ජනතාවට තහවුරු කරන ලදී. මාර්තු මාසය මැද භාගයේ දී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා “නිරෝධායනය කර ඇති පුද්ගලයින් ගෙන් ගාස්තුවක් අය කර ගන්නා බවට ඇති චෝදනා” ප්‍රතික්ෂේප කළේය.[43] නිරෝධායන මධ්‍යස්ථානවල සිටින කිසිවෙකුගෙන් ගාස්තුවක් අය නොකරන බව සෞඛ්‍ය අමාත්‍යාංශය ද නිවේදනයක් නිකුත් කරමින් අවධාරණය කළේය[44]. කෙසේ වෙතත්, මෙම කාලවකවානුවේ දී ම, හෝටල් හිමි සමාගම් විසින් එම හෝටල් නිරෝධායන මධ්‍යස්ථාන[45] ලෙස යොදා ගැනීම සඳහා ලබා දීමට ‘ඉදිරිපත් වෙමින්’ සිටි අතර, ප්‍රශ්නගත ආපසු පැමිණෙන්නන්ට හෝටල් වල නිරෝධායනය වීම සඳහා ප්‍රවේශය තිබේ නම් රජය ඔවුන් ආපසු ගෙන්වා ගැනීමේ මෙහෙයුම්වලට පහසුකම් සලසන බවක් පෙනෙන්නට තිබුණි. නැවත ගෙන්වා ගැනීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහාය ඇතිව පහසුකම් සලසන ලද අතර, ශ්‍රී ලංකන් ගුවන් සමාගම “විශේෂ ගුවන් යානයක් යෙදවීමේ දී මගීන් ගෙන ඒම සඳහා හිස් ගුවන් යානයක් යැවීමට සිදුවීමත්, ආපසු පැමිණෙන විට ගුවන් යානයෙන් භාගයක් පමණක් මගීන්ගෙන් පිරී තිබීමත්, මගීන් සඳහා වසා ඇති විදෙස් රටවල ගුවන් තොටුපළ විවෘත කරවා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවීමත් නිසා ඒ සඳහා අතිශය ඉහළ පිරිවැයක් දැරීමට සිදු වන බව” සඳහන් කරමින් අප්‍රේල් මාසයේ දී නැවත ගෙන්වා ගන්නා ලද පුද්ගලයන්ගේ ගුවන් ටිකට්පත් මිල අධික වීම සාධාරණීකරණය කළේය.[46]

ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ගෙන් බහුතරයක් සේවයේ යෙදී සිටින මැද පෙරදිග රටවල රැකියා කෙරෙහි වසංගතයෙන් දැඩි බලපෑමක් එල්ල විය.[47] එහි ප්‍රතිඵලයක් ලෙස, බොහෝ ශ්‍රී ලාංකිකයන්ට රැකියා අහිමි වී කිසිදු මුදලක් නොමැති වීමෙන් නැවත මෙරටට පැමිණීමට රජයේ සහාය අවශ්‍ය වියය. රජය විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් සඳහා ආරම්භ කරන ලද වෙබ් අඩවියෙහි දහස් සංඛ්‍යාත පිරිසක් ලියාපදිංචි වී සිටියහ. අප්‍රේල් මැද භාගයේදී, ආපසු ගෙන්වා ගැනීම් සඳහා පහසුකම් සැලසීම පිණිස විදේශ අමාත්‍යාංශය විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග අත්වැල් බැඳගත්තේය.[48] විදෙස් රටවල අතරමංවී සිටින්නන්ගේ හදිසි අවශ්‍යතා ඉටුකර දීම සඳහා උපකාර වීම පිණිස සුභ සාධන සහාය ලබාදීම ද ඔවුන්ගේ සැලසුම් අතර විය. මෙවැනි සැලසුම් තිබියදීත්, තමන්ව අතහැර දමා සහ නොසලකා හැර ඇති බවට චෝදනා කරමින් විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල ඉදිරිපිට විරෝධය දක්වන්නන් ඔවුන්ගේ සජීවී දර්ශන පළ කළ අතර, ඉලක්ක කළ කණ්ඩායම් වෙත එම සහන නොලැබීම පිළිබඳ වාර්තා මාධ්‍යවල සුලභව පළ විය. කෙසේ නමුත්, එය එසේ නොවන බව රජය ස්ථිර ලෙස ම පැවසුවේය. ජූනි මාසය අගභාගයේ දී, සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග, “රජය කොවිඩ්-19 ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා සහ ලෝකයේ විවිධ රටවල තවමත් අතරමංවී සිටින ශ්‍රී ලාංකිකයන් නැවත ගෙන්වා ගැනීම සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී ඇති බැවින් ගුවන් තොටුපළ නැවත විවෘත කරන නිශ්චිත දිනයක් කීමට අපට නොහැකියි”[49] යනුවෙන් සඳහන් කළේය. එහෙත්, ජූලි මාසය තරම් පසු කාලයක් වන විට පවා, විදේශ ආමාත්‍යාංශයේ ලේකම් රවිනාත් ආර්යසිංහ සඳහන් කල ආකාරයට, “2020 ජූනි 16 දින වන විට රටවල් 117 ක 52,401 දෙනෙක් (විදේශගත ශ්‍රී ලාංකිකයන්) ආපසු ගෙන්වා ගැනීමට (ඉතිරිව) සිටියහ. ආපසු පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටි සිසුන් සංඛ්‍යාව 2,590 ක් (4.9%) ද, කෙටිකාලීන වීසා දරන්නන් සංඛ්‍යාව 5,825 ක් (11.12%) ද වූ අතර, ඉතිරි අයගෙන් 39,001 (74.43%) ක් සංක්‍රමණික සේවකයින් විය. මොවුන් ගෙන් 26,321 (50.23%) ක් ජීවත් වූයේ මැද පෙරදිග කලාපයේ ය.”[50] ජූලි මස අවසානය වන විටත් එම තත්ත්වය එලෙසම පැවතුණි. ඔහු ප්‍රකාශ කළ අන්දමට, ජූනි 25 වන දා වන විට, 2020 පෙබරවාරි 1 වන දින වූහාන් වල සිසුන් 33 දෙනා ගෙන්වා ගැනීමත් සමග නැවත ගෙන්වා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භවූ අවස්ථාවේ සිට නැවත ගෙන්වා ගැනීම සඳහා යොදවන ලද ගුවන් යානා වලින් මේ දක්වා ගෙන්වා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව 10,355 දෙනෙක් පමණි.[51] ඔහු තවදුරටත් සඳහන් කළ පරිදි, නැවත ගෙන්වා ගනු ලබන්නේ කවරෙක්ද යන්න තීරණය කරනු ලබන්නේ පාලනයේ ඉහළම මට්ටම්වල අධිකාරින් විසින් ය: “නැවත මෙරටට ගෙන්වා ගැනීමේදී (විදෙස්ගත ශ්‍රී ලාංකිකයින්) විදේශ අමාත්‍යාංශය, කුමන ගුවන් යානා යොදවන්නේද යන්න සහ අදාළ ක්‍රමවේදය කුමක්ද යන්න

තීරණය කරන පාර්ශ්ව වන ජනාධිපති ලේකම් කාර්යාලය සහ කොවිඩ්-19 ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සමීපව සම්බන්ධීකරණය කරයි. ශ්‍රී ලංකන් ගුවන් සේවය ගුවන් ගමන් පහසුකම් සම්පාදනය කිරීමට සහයෝගය දක්වයි; ආරක්ෂක අංශ නිරෝධායන කටයුතු සිදුකිරීමේ වගකීම දරන අතර, සෞඛ්‍යය අධිකාරින් සෞඛ්‍යය පරික්ෂාවන් සහ අනිශ්චිත තත්ත්වයන් සඳහා සූදානම්ව සිටිති.”

කෙසේ වෙතත්, ජූලි මස මැද භාගය වන විට, විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් ආපසු ගෙන්වා ගැනීමට ප්‍රමුඛත්වය ලබා දෙන බව රජය ප්‍රකාශ කර තිබියදීත් එම කාර්යය තාවකාලිකව නවතා දමන ලදී. විදේශ අමාත්‍යාංශයේ නැගෙනහිර ආසියා අංශයේ අධ්‍යක්ෂ ජෙනරාල් කන්දීපන් බාලසුබ්‍රමනියම් මාධ්‍යයට අදහස් දක්වමින් මෙසේ ප්‍රකාශ කළේය: “මෙරට කොවිඩ්-19 ආසාදිතයින් සංඛ්‍යාව කළමනාකරණය කරගත හැකි ප්‍රමාණයක් දක්වා අඩුවන තුරු අපි මෙරටට ආපසු ගෙන්වා ගැනීමේ ක්‍රියාවලිය තාවකාලිකව නවතා දැමුවා... අපිට නිරෝධායන මධ්‍යස්ථාන වල ධාරිතාවයන් ඉක්මවා යාමට ඉඩදිය නොහැකියි. මෙරට කොවිඩ්-19 ආසාදිතයින් සංඛ්‍යාව පාලනය කර ගත් පසු නැවත ගෙන්වීමේ ක්‍රියාවලිය යළි ආරම්භ කරනවා”. එම කාලය තුළදී හඳුනා ගන්නා ලද කොවිඩ් ආසාදිතයින් ගෙන් විශාල සංඛ්‍යාවක් එලෙස ආපසු පැමිණි පුද්ගලයින්ට සම්බන්ධකම් තිබූ අය වීම හේතුවෙන් එය සාධාරණීකරණය වූවා විය හැක. කෙසේ වෙතත්, තම ශ්‍රී ලාංකික පුරවැසියන් විදේශ රටකදී වසංගතයට නිරාවරණය කොට අත්හැර දමනවාට වඩා, මෙරට නිරෝධායන ධාරිතාවන් ඉහළ නංවා, නැවත පැමිණෙන්නන් නිරෝධායනය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම වඩා උචිත වන්නට තිබුණි. කෙසේ හෝ, නැවත ගෙන්වා ගැනීම අත්හිටුවන බව ප්‍රකාශ කළත්, නැවත ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් පිළිබඳ වාර්තා අඛණ්ඩව මාධ්‍යවල පළ විය. උදාහරණයක් ලෙස, අගෝස්තු මස මුල දී, බෞද්ධ භික්ෂූන් සහ ශිෂ්‍යයින් ඇතුළත් ශ්‍රී ලාංකිකයන් 87 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ගුවන් යානයකින් නැවත ගෙන්වා ගන්නා ලදී.[52] අගෝස්තු මස අගභාගයේ දී, ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර සිට ආපසු පැමිණෙනන් රැගත් ගුවන් යානයක් මෙරටට පැමිණි බව වාර්තා වූ අතර,[53] සැප්තැම්බර් මාසයේ දී සීෂෙල්හි සිට රැකියා අහිමි වූ ශ්‍රී ලාංකිකයන් මෙරටට ගෙන්වා ගත් බව දක්නට ලැබුණි.[54] ඇත්ත වශයෙන් ම, ඔක්තෝම්බර් මාසය වන විට අලුතින් කොවිඩ් පොකුරු බිහිවීම හේතුවෙන් නැවත ගෙන්වා ගැනීමේ වැඩසටහන අඩපණ වූ අවස්ථාවේ දී හමුදා ප්‍රධානී ශවේන්ද්‍ර සිල්වා මාධ්‍ය වෙත ප්‍රකාශ කළ පරිදි ඒ දක්වා ම විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් 300 ත් 400 ත් අතර ප්‍රමාණයක් දිනපතා ආපසු මෙරටට රැගෙනවිත් තිබුණි.[55] කෙසේ වෙතත්, ඔක්තෝම්බර් මාසය වන විට, ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙක් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටී අතර, ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් මුහුණ දී සිටි අවදානම මෙරට සිටි ශ්‍රී ලාංකිකයින් මුහුණ දුන් අවදානම මෙන් හය ගුණයකටත් වඩා ඉහළ ගොස් තිබුණි .[56]

## සංචාරක කර්මාන්තය නැවත ආරම්භ කිරීම

ජූනි මාසයේ දී රට වසා දැමීම ලිහිල් වූ විට, සහ මහා මැතිවරණය පෙනෙන මානයේ තිබියදී, ශ්‍රී ලංකාව ව්‍යාජ සාමාන්‍ය තත්වයක් කරා පියමනිමින් සිටියේය. රට වසා තිබූ එයට පෙර මාස කිහිපය තුළ දී, බොහෝ දෙනෙකුට තම රැකියා සහ ව්‍යාපාරික කටයුතු අහිමි වීම හේතුවෙන් ඔවුන්ගේ ජීවිතය සම්පූර්ණයෙන් ම වෙනස් වී තිබූ අතර, ආහාර සහ අත්‍යාවශ්‍ය සේවා බෙදිහැරීමේ පද්ධතිය විසින් ආර්ථිකමය වශයෙන් වඩාත් පීඩාවට පත්ව සිටියවුන් බොහෝ දුරට බැහැර කිරීම නිසා රට වසා තැබීම ම ඔවුන්ගේ මීළඟ ජීවන අරගලයන් තවත් උග්‍ර කළේය. අන්තර්ජාතික පැමිණීම් සීමා කිරීම සංචාරක කර්මාන්තයෙහි නියැළී සිටි පුද්ගලයින්ට හා සමාගම් වලට, විශේෂයෙන් ම සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර වලට මෙන්ම සංචාරක මග පෙන්වන්නන්, රියදුරන්, කුඩා කඩ හිමියන් වැනි ස්වයං රැකියා වල නියුතු වූවන්ට දැඩි බලපෑමක් එල්ල කළේය. වඩාත් බලපෑම් එල්ල විය. පැහැදිලිව ම, දේශ සීමා යළි විවෘත කරන ලෙස සහ සංචාරක කර්මාන්තය නැවත ආරම්භ කරන ලෙස රජයට බලපෑම් එල්ල වෙමින් පැවතුණි.

මෙලෙස එල්ල වෙමින් පැවති පීඩනයන් සියලු ශ්‍රී ලාංකිකයින් ආරක්ෂා කිරීම පිණිස ශ්‍රී ලංකා දේශ සීමා තුළින් වෛරසය තුරන් කිරීමේ අවශ්‍යතාවයට ප්‍රතිවිරුද්ධ විය. ආරම්භයේදී, රජය රට වසා තැබිය යුතුය යන ස්ථාවරයේ සිටියේය. එහෙත් ජූනි මාසයේ දී, අගෝස්තු මස 1 වන දින සිට සංචාරක කර්මාන්තය සඳහා දේශ සීමා නැවත විවෘත කරන බවට පොරොන්දු වූවත්, සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග දිගින් දිගට ම එම දිනය කල් දැමූ අතර, [57] අවුරුද්දේ ඉතිරි කාලය පුරා ම රට වසා තබන ලදී.

කෙසේ නමුත්, රට නැවත විවෘත කිරීම පිළිබඳ කතාබහ අඛණ්ඩව පැවතුණි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විදේශීය සංචාරකයින් රට තුළ සංචාරය කරන විට "ඔවුන් ගමන් කළ ස්ථාන සොයා ගැනීමට හැකි" වන යෙදුමක් (app) හඳුන්වා දුන්නේය.[58] එමෙන් ම, අධිකාරිය කොවිඩ්-19 වසංගතයෙන් පසු අවධියේ දී මෙහෙයුම් ආරම්භ කිරීමට සූදානම්ව සිටි, අධිකාරියේ ලියාපදිංචි සියලු ම ආයතන වලට 'සුරක්ෂිත සහ ආරක්ෂිත' අනුකූලතා සහතිකකරණ ක්‍රමයක් හඳුන්වා දී එය ක්‍රියාත්මක කිරීම කඩිනම් කළේය.[59] කෙසේ වෙතත්, සැප්තැම්බර් මුල් භාගය වන විට, මේ සඳහා ලැබී තිබුණේ අයදුම්පත්‍ර 160 ක් පමණක් වූ අතර, එම සහතිකරණය ලබා ගැනීම සඳහා ඇති උනන්දුව හීනවී ගොස් තිබූ බවක් පෙනෙන්නට තිබුණි.[60] මෙම අංශයේ ආර්ථික වශයෙන් බලපෑමට ලක්ව සිටියවුන්ට සුභසාධන පැකේජයක් හඳුන්වා දෙනු ලැබුවත්, සුභසාධානය අවශ්‍යව සිටි පුද්ගලයින් විශාල ප්‍රමාණයකට ඒ සඳහා අවශ්‍ය විධිමත් සුදුසුකම් නොතිබුණි. ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ සභාපති කිමර්ලි ප්‍රනාන්දු මහත්මිය සඳහන් කළ ආකාරයට, සංචාරක අංශයේ ක්‍රියාත්මක වන ආයතන 25,000 ක් පමණ අවිධිමත් සහ ලියාපදිංචි නොවූ ඒවා වීම මෙයට හේතුව විය.[61] ආරක්ෂිත සහතිකකරණය ලබා ගැනීම සඳහා ලැබුණු අයදුම්පත් ප්‍රමාණය අඩුවීමට ද එම හේතුව ම බලපෑවේය. අගෝස්තු මාසයේ දී, "තරු පහේ හෝටල් වල සිට නවාතැන් පහසුකම් සපයන නිවාස" දක්වා වූ සියලු ආකාරවල නවාතැන් පහසුකම් සපයන්නන් සඳහා අදාළ වන, කොවිඩ් වසංගතයෙන් පසු සංචාරකයින්ට නවාතැන් සපයා දීම පිළිබඳ පිටු 90 ක මාර්ගෝපදේශයක් ලබා දී,[62] ඒ සමග ම ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ දැ අවුරුදු උපාය මාර්ගික සැලස්මක් ද එළිදක්වන ලදී.[63] කෙසේ වෙතත්, මේ සියල්ලක් ම අනාගතයේ නොදන්නා දිනයක දී රට විවෘත වන්නේය යන බලාපොරොත්තුව ඇතිව ගත් පියවර වන අතර, කිමර්ලි ප්‍රනාන්දු සඳහන් කළ ආකාරයට රට විවෘත කිරීමේ තීරණය සෞඛ්‍ය නිලධාරින් විසින් ගනු ලබන්නක් වේ.[64]

සැප්තම්බර් මාසයේ දී ද, ගුවන් තොටුපළ විවෘත කිරීම දින නියමයක් නොමැතිව කල් දමා තිබූ නමුත් ඒ පිළිබඳව තිබූ බලාපොරොත්තු ඉහළ මට්ටමක පැවතුණි. ඇමති රණතුංග සඳහන් කළ ආකාරයට, "ගුවන් තොටුපළ විවෘත කිරීම සම්බන්ධ නිර්දේශ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති" අතර, සෞඛ්‍ය බලධාරීන් අවසර දුන් වහාම අමාත්‍යාංශය ගුවන් තොටුපළ විවෘත තරනු ඇත.[65] සෞඛ්‍ය බලධාරින්ගේ අවසරය ලැබී පැය 12 ක් ඇතුළත සංචාරක කර්මාන්තය නැවත ආරම්භ කිරීමට සූදානම් බව සංචාරක රාජ්‍ය අමාත්‍ය ඩී. වී. චානක කලින් පවසා තිබුණි. මේ අතරතුර, ඔක්තෝම්බර් මාසයේ දී, පළමු වතාවට, රජය තෝරාගන්නා ලද රටවල් සමග සංචාරක බුබුළු ඇති කිරීමේ හැකියාව සාකච්ඡා කළේය.[66] එහෙත්, කොවිඩ් වසංගතය තුරන් කිරීමේ කාර්යයට ප්‍රමුඛත්වය ලබා දීමේ අරමුණ නිසා මෙම අදහස අනුමත නොවීය. ඇමති රණතුංග පැවසූ ආකාරයට, "අපි කොවිඩ්-19 ජාතික කාර්ය සාධක බලකා රැස්වීමේදී පවා යුරෝපයෙන්, අග්නිදිග ආසියාවෙන්, සහ රුසියාවෙන් සංචාරක කණ්ඩායම් ගෙන්වීමට ඇති අවස්ථාව පිළිබඳව සාකච්ඡා කළ නමුත්, කොවිඩ්-19 වසංගතය නිසා කිසිදු සංචාරකයෙක් රට තුළට ගෙන්වීමට ඔවුන්ගේ අවසරය නොලැබුණි."[67] ඒ කෙසේ වෙතත්, ඒ ආකාරයේ සියලු ඇඟවීම් තිබුණ ද, රට විවෘත කරනු ලැබුවත් සංචාරක කර්මාන්තය නැවත ආරම්භ කිරීමට වඩා ආපසු ගෙන්වා ගැනීම් වලට ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.[68]

කෙසේ නමුත්, ඔක්තෝම්බර් මැද වන විට සියල්ල වඩාත් නරක අතට හැරුණේය. ශ්‍රී ලංකාවේ විශාලතම ඇඟළුම් කර්මාන්ත ශාලා වලින් එකක් වන බ්‍රැන්ඩික්ස් ආයතනයට අයත් එක් කර්මාන්ත ශාලාවක් කොවිඩ්-19 වැළැක්වීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වී ඇතැයි පැවසෙන තත්වයක් නිසා එහි සේවකයින් ආශ්‍රිතව රෝගීන් පොකුරක් නිර්මාණය වීම හේතුවෙන් එම ආයතනය දැඩි අවධානයට ලක් විය. එහි සේවකයින් එක්දහස් පන්සියයකට (1,500) වැඩි සංඛ්‍යාවකට කොවිඩ් වෛරසය ආසාදිත වී ඇති බවට තහවුරු වීමත් සමග රට දැඩි ලෙස පරීක්ෂාකාරී වූ අතර, නැවත වරක් රට අර්ධ වශයෙන් වසා දමන ලදී.[69] දිගින් දිගට ම රෝගීන් වාර්තා වීම නිසා රටේ දේශ සීමා සම්පූර්ණයෙන් විවෘත කිරීම තවදුරටත් කල් ගියේය.

නොවැම්බර් මුල් කාලයේ දී, සංචාරක අමාත්‍යාංශය ප්‍රධාන හෝටල් හිමිකරුවන් ගෙන් සමන්විත, ජෙට්වින් සිම්ෆනි ආයතනයේ සභාපති හිරාන් කුරේ ගේ සභාපතිත්වයෙන් යුත් සංචාරක උපදේශන කමිටුවක් පිහිටුවන ලදී. "ආරම්භයේ දී සංචාරක බුබුලක් හෝ සංචාරක කොරිඩෝවක් නිර්මාණය කිරීම මගින් සංචාරක කර්මාන්තය සඳහා රට නැවත විවෘත කිරීමට අවශ්‍ය කාර්යරාමු සහ යෝජනා ඉදිරිපත් කිරීමට මෙන්ම, ඒ අතර කාලයේ දී, සංචාරක ක්ෂේත්‍රය මත යැපෙන්නන් සඳහා කෙටිකාලීන විකල්ප ජීවනෝපාය මාර්ග සෙවීමේ" කාර්යය එම කමිටුව වෙත පැවරුණි.[70] එම රැස්වීමේදී, කුරේ "පොළිය එකතු වෙමින් පැවතීම නිසා  මෙම අංශයේ පාර්ශ්වකරුවන්ට කිසිදු ආදායමක් නොමැතිව

ඒවා ගෙවීමට නොහැකි වීමෙන් ඔවුන් වර්තමානයේ අත්විඳින මූල්‍ය අපහසුතා අවධාරණය කළ අතර, මේ සඳහා යම් ආකාරයක රජයේ සහාය අවශ්‍ය බව සඳහන් කළේය.” [71]

දෙසැම්බර් මාසයේ දී, සෞඛ්‍යය අමාත්‍යාංශයේ කොවිඩ්-19 සායනික කළමනාකරණ විද්වත් කමිටුවේ යෙදවුම් සහිතව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් අන්තර්ජාතික සංචාරක කර්මාන්තය නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් “සියල්ල ඇතුළත් මාර්ගෝපදේශයක්” සකස් කර එය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එම අධිකාරියේ සභාපති කිමර්ලි ප්‍රනාන්දු, 2021 ජනවාරි 1 වන දින සිට අන්තර්ජාතික සංචාරකයින් සඳහා ගුවන් තොටුපළ විවෘත කිරීමට නිර්දේශ කර තිබුණි. සංචාරකයින් පැමිණීමෙන් පසු මෙරට සංචාරය කිරීම සම්බන්ධයෙන් බොහෝ සීමාකිරීම් තිබූ අතර, ආරක්ෂිත සහතිකය සහිත හෝටල්වල පමණක් නවාතැන් පහසුකම් ලබා ගන්නා ලෙද උපදෙස් ලබා දී තිබුණි.[72] මේ අතරතුර, ශ්‍රී ලංකාව එන්නත් ලබාගත් සංචාරකයන්ට මෙරටට පැමිණීමට අවසර ලබාදීම සම්බන්ධයෙන් සලකා බැලිය යුතු බව පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවකදී සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග සඳහන් කළේය.[73] කෙසේ වෙතත්, මෙම අවස්ථාවේ දී වුවද, නැවත රට විවෘත කිරීම සලකා බලමින් සිටියා මිස ඒ සම්බන්ධයෙන් ස්ථිර තීරණයක් ප්‍රකාශ නොකරන ලදී. එහෙත්, පිටත්වීමට පෙර පී.සී.ආර්. පරීක්ෂණ සිදු කළ, යුක්‍රේනයේ සිට පැමිණෙන සංචාරකයන් පිරිසක් රැගත් පළමු වැනි විශේෂ ගුවන් යානය විශේෂ ආරක්ෂක මාර්ගෝපදේශ යටතේ දෙසැම්බර් 28 වන දින මෙරටට පැමිණීමට නියමිත බව නත්තල් සමය ආසන්නයේ දී හදිසියේ ප්‍රකාශ කරන ලදී.[74] මුල් සැලැස්මට අනුව දෙසැම්බර් 28 සිට ජනවාරි 24 දක්වා කාලය තුළ ගුවන් යානා 24 ක් මගින් එකකින් යුක්‍රේන සංචාරකයන් 215 දෙනා බැගින් ගෙන්වීමට අපේක්ෂා කරන ලදී. වාර්තා වූ අන්දමට, නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංග විසින් මෙහෙයවන ලද අතර, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ, ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන්කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති බැසිල් රාජපක්ෂ සහ සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග ඒ සඳහා පූර්ණ අනුබලය ලබා දී ඇත.[75] විවිධ පූර්වාරක්ෂක ක්‍රමවේද අනුගමනය කර ඇති බවට සහතිකවීම් ලබා දී තිබියදීත්, ඔවුන් පැමිණ දින කිහිපයක් ගතවන විට ම, යුක්‍රේන ජාතිකයන් කිහිප දෙනෙකුට කොවිඩ්-19 ආසාදනය වී ඇති බව තහවුරු විය.[76] යුක්‍රේන ජාතික සංචාරකයින් කණ්ඩායම සිය ආයතනයේ අධීක්ෂණයෙන් බැහැරව සංචාරය කරන බව ශ්‍රී ලංකා සංචාරක අධිකාරී සභාපති කිමර්ලි ප්‍රනාන්දු විසින් එසැනින් ජනාධිපතිවරයාට ලිපියක් මගින් දැනුම් දෙන ලදී.[77] මෙලෙස, අවස්ථාව එළඹෙන තෙක් මාස ගණන් බලා සිටිමින් ඉතා සැලකිලිමත්ව සැලසුම් සකස් කර තිබියදීත්, අවසානයේ සංචාරකයන් සඳහා රට විවෘත කළ විට, එය බිය සහිත අවුල් සහගත තත්වයක් බවට පත් විය. නව වසර එළඹෙන විට බොහෝ දෙනාට එය අසුබදායක බවෙන් පිරි ඇති වසරක් ලෙස හැඟී ගියේය.

## සමාප්තිය

සමස්තයක් ලෙස බැලූ විට, කොවිඩ්-19 වසංගතය තුළ දී, විශේෂයෙන් ම එහි ආරම්භක අවධියේදී, ශ්‍රී ලංකාව දේශ සීමා ප්‍රතිපත්තිය හැසිරවූ ආකාරය ඵලදායී බව පෙනෙන්නට තිබේ. කෙසේ වෙතත්, වසංගතයේ පළමු වසර තුළ රජයේ ප්‍රතිපත්ති වෙනස්වූ ආකාරය දෙස සමීපව බලන විට එහි බොහෝ මග හැරුණු අවස්ථා සහ කඩවූ පොරොන්දු දක්නට ලැබේ. ගුවන් තොටුපළ වසා ඇති බව නිවේදනය කළ ද, මුළු වසර පුරා ම පාහේ විදේශ රටවල සිට පැමිණීම් අඛණ්ඩව සිදු විය. නිරෝධායනය අනිවාර්ය බව ප්‍රකාශයට පත් කළද, මෙය බොහෝ දෙනා විසින් කඩ කරනු ලබන බව හෝ වරින් වර රජය විසින් ම ලිහිල් කරනු ලබන බව දක්නට ලැබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ‘ආනයනය කරන ලද’ කොවිඩ් රෝගීන් සමස්තයක් ලෙස රටපුරා රෝග ව්‍යාප්තිය වැඩි වීමට බලපෑ ප්‍රධාන හේතුවක් විය. ආපසු ගෙන්වා ගන්නා බවට පොරොන්දු ලබා දුන් නමුත්, ශ්‍රී ලංකාව දීර්ඝ කාලයක් තිස්සේ විදේශ විනිමය සඳහා යැපුණු විදේශ සම්ප්‍රේෂණ මෙරටට උපයා දුන්, විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් විශාල පිරිසක් වසර අවසානය වන විටත් එම රටවල අතරමංවී සිටින මට්ටමට එම ක්‍රියාවලිය පුරා අසමානතා දක්නට ලැබුණි. සුපරීක්ෂාකාරීව සලකා බැලීමෙන් පසුව හා දැඩි සෞඛ්‍යය මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමෙන් පසුව පමණක් දේශ සීමා විවෘත කරනු ලබන බවට පොරොන්දු වූ නමුත්, සංචාරකයින් රෝගය ව්‍යාප්ත කිරීම පමණක් නොව, බලධාරීන්ගේ පාලනය ද ඉක්මවා ක්‍රියා කරන බව පළමු සංචාරකයින් කණ්ඩායම විසින් ම ඔප්පු කරන ලදී.

ශ්‍රී ලංකාවට වසංගතය පැමිණි දින පටන්, වෛරසය හේතුවෙන් දස දහස් ගණනකට ජීවිත අහිමි

වූ අතර, ආර්ථික දුෂ්කරතා හේතුවෙන් තවත් විශාල සංඛ්‍යාවකගේ ජීවිත දැඩි බලපෑමට ලක්වී තිබේ. විශේෂයෙන් ම නීති සහ අදාළ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අපොහොසත්වීමෙහි ප්‍රතිඵල ලෙස වෛරසය පැතිරීමට හේතු වූ කරුණු පිළිබඳ සමස්ත ඇගයීමක් සිදු කිරීම අනාගතයේදී ශ්‍රී ලංකාව තුළ වඩාත් වගවීමක් සහිත පාලනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන අතර, එය වසංගතය (එය වැරදි ලෙස කළමනාකරණය කරනු ලැබීම ද ඇතුළත්ව) හේතුවෙන් බලපෑමට ලක්වූවන්ට සිදුවූ අහිමිවීම් වලට පිළියම් ලබාදෙන බව සහතික කිරීම සඳහා වන අත්‍යාවශ්‍ය පියවරක් ද වේ. ශ්‍රී ලංකාවට වසංගතය ව්‍යාප්තවීම පාලනය කිරීම ඉතා මැනවින් සිදු කිරීමේ හැකියාව ඇති බව දැන සිටියදීත්, වසංගතය වැරදි ලෙස කළමනාකරණය කරනු ලැබීම විශේෂයෙන් ම අධෛර්යමත් කරවන්නක් වේ. මෙය කාර්යක්ෂම මහජන සෞඛ්‍ය යටිතල ව්‍යූහය විසින් මෙයට පෙර ක්‍රියාත්මක කළ බරවා සහ මැලේරියා වැනි රෝග මර්දනය කිරීමේ ව්‍යාපාර වලින් මනාව පැහැදිලි වෙයි. කොවිඩ්-19 වසංගතය සඳහා රජය ප්‍රතිචාර දැක්වූ ආකාරය විමසා බැලීමේදී ශ්‍රී ලංකාව මෙම තත්ත්වයට පත්වීම අපේක්ෂා කළ හැකි දෙයක් වේ. රටේ දේශ සීමා ප්‍රතිපත්ති සහ වසංගත කළමනාකරණය පිළිබඳ මෙම විශ්ලේෂණය පසුගිය කාලයේ දක්නට ලැබුණු පරිදි රෝගය ව්‍යාප්තවීම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සතු හැකියාව මත පදනම්ව ඇත.

# මූලාශ්‍ර

[1] Govt. offers sops to airlines as crises-hit tourism slumps | Daily FT (2.3.2020)
[2] SL on alert for Coronavirus | Daily FT (25.1.2020)
[3] BREAKING NEWS : Confirmed case of Coronavirus in Sri Lanka (newsfirst.lk) (27.1.2020)
[4] Govt. unleashes multipronged fight against coronavirus | Daily FT (29.1.2020)
[5] Govt. unleashes multipronged fight against coronavirus | Daily FT (29.1.2020)
[6] BIA battles on against coronavirus | Daily FT (1.2.2020)
[7] BIA reopened for visitors from today | Daily FT (6.3.2020)
[8] News 1st: Prime Time Sinhala News - 7 PM | (13-03-2020) - YouTube (13.3.2020)
[9] Govt. tightens COVID-19 prevention measures as total cases climb to two | Daily FT (13.3.2020)
[10] Govt. intensifies COVID-19 battle, patient count reaches 5 | Daily FT (14.3.2020)
[11] Govt. intensifies COVID-19 battle, patient count reaches 5 | Daily FT (14.3.2020)
[12] BIA will not be shut down, says AASL Chief | Daily FT (17.3.2020)
[13] BIA will not be shut down, says AASL Chief | Daily FT (17.3.2020)
[14] News 1st: Prime Time Sinhala News - 7 PM | (17-03-2020) - YouTube (timestamp: 5:33)
[15] BIA will not be shut down, says AASL Chief | Daily FT (17.3.2020)
[16] SL closed for all countries until 31 March | Daily FT (25.3.2020)
[17] Govt. appeals to overseas Sri Lankans to stay in respective countries | Daily FT (27.3.2020)
[18] Govt. appeals to overseas Sri Lankans to stay in respective countries | Daily FT (27.3.2020)
[19] BIA extends ban on incoming passenger flights till 7 April | Daily FT (28.3.2020)
[20] SL extends suspension of all types of visas | Daily FT (29.3.2020)
[21] SL on alert for Coronavirus | Daily FT (25.1.2020)
[22] 21 Lankan students in China return to SL following coronavirus outbreak | Daily FT (28.1.2020)
[23] BIA battles on against coronavirus | Daily FT (1.2.2020)
[24] Govt. starts PCR tests at BIA | Daily FT (2.6.2020)
[25] Govt. further expands COVID-19 treatment facilities | Daily FT (20.3.2020)
[26] News 1st: Prime Time Sinhala News - 7 PM | (17-03-2020) - YouTube (timestamp: 5:00)
[27] Hendala Leprosy Hospital selected as quarantine facility | Daily FT (5.3.2020)
[28] Fresh COVID-19 quarantine measures rolled out from today | Daily FT (10.3.2020)
[29] Govt. defends COVID-19 quarantine measures amidst criticism | Daily FT (12.3.2020)
[30] Govt. tightens COVID-19 prevention measures as total cases climb to two | Daily FT (13.3.2020)
[31] Govt. intensifies COVID-19 battle, patient count reaches 5 | Daily FT (14.3.2020)
[32] President unveils relief measures, appeals for unity in fight against COVID-19 | Daily FT (18.3.2020)
[33] One more COVID-19 death, total cases at 189 | Daily FT (9.4.2020)
[34] New high of 865 COVID-19 patients | Daily FT (24.10.2020)
[35] SriLankan Airlines' crew recounts mercy mission to Wuhan | Daily FT (4.2.2020)
[36] News 1st: Prime Time Sinhala News - 7 PM | (17-03-2020) - YouTube (timestamp: 5:33)
[37] Govt. appeals to overseas Sri Lankans to stay in respective countries | Daily FT (27.3.2020); Special request by the Government to Sri Lankan expats - President's Media Division (pmdnews.lk) (27.3.2020)
[38] All Buddhist pilgrims stranded in India repatriated | Daily FT (22.3.2020)
[39] FM tracking SL students in South India amidst lockdown | Daily FT (27.3.2020)
[40] SL Embassy in Nepal reaches out to Lankans, assures support in wake of COVID-19 restrictions | Daily FT (30.3.2020)
[41] Lankans in Bangladesh appeal to Govt. to evacuate them urgently | Daily FT (12.4.2020)
[42] Lankans in Bangladesh appeal to Govt. to evacuate them urgently | Daily FT (12.4.2020)
[43] First batch of travellers from South Korea quarantined | Daily FT (11.3.2020)
[44] Citrus offers 150-room Waskaduwa resort for use as quarantine centre | Daily FT (21.3.2020); Hemas offers Club Hotel Dolphin as quarantine centre | Daily FT (21.3.2020); JKH offers Trinco Blu as quarantine centre | Daily FT (21.3.2020)
[45] First batch of travellers from South Korea quarantined | Daily FT (11.3.2020)
[46] SriLankan Airlines explains high costs of running Coronavirus rescue flights | EconomyNext (26.4.2020)
[47] 'I'm trapped': the UAE migrant workers left stranded by Covid-19 job losses | Coronavirus | The Guardian (20.4.2020)

[48] Foreign Ministry and Foreign Employment Bureau team up to assist migrant workers in ME | Daily FT (16.4.2020)
[49] Airport reopening pushed back to mid-August: Prasanna | Daily FT (30.6.2020)
[50] Role of foreign employment in Sri Lanka's economic revival: Challenges and opportunities | Daily FT (8.7.2020)
[51] Role of foreign employment in Sri Lanka's economic revival: Challenges and opportunities | Daily FT (8.7.2020)
[52] Daily Mirror - Sri Lanka Latest Breaking News and Headlines - Print Edition A second group of Sri Lankans repatriated from Thailand (22.8.2020)
[53] Special repatriation flight for Sri Lankans in Perth, Australia - Adaderana Biz English | Sri Lanka Business News (26.8.2020)
[54] Sri Lanka : Another 472 stranded Sri Lankans repatriated (colombopage.com) (11.9.2020)
[55] Sri Lanka slows repatriation flights at airport as Covid-19 quarantine needs go up | EconomyNext (11.10.2020)
[56] Minuwangoda COVID-19 cases threaten migrant workers' prospects for return | Daily FT (12.10.20200
[57] Airport reopening pushed back to mid-August: Prasanna | Daily FT (30.6.2020); BIA reopening pushed back to September | Daily FT (21.7.2020); Airports will open before April - Official | Daily News (16.9.2020); Sri Lanka : Sri Lanka airports will not be opened until COVID-19 is 100% controlled - Tourism Minister (colombopage.com) (17.9.2020)
[58] All-inclusive Sri Lanka Tourism app now ready | Daily FT (11.8.2020)
[59] SLTDA fast-tracks issuance of 'Safe and Secure' tourist hotel compliance certification | Daily FT (11.8.2020)
[60] Mixed response to 'Safe and Secure' COVID-19 certification from tourism industry | Daily FT (7.9.2020)
[61] SPOTLIGHT with Larry | KIMARLI FERNANDO - YouTube (29.6.2020)
[62] SPOTLIGHT with Larry | KIMARLI FERNANDO - YouTube (29.6.2020)
[63] Sri Lanka Tourism Strategic Action Plan 2020-2022 to reform industry | Daily FT (26.8.2020)
[64] SPOTLIGHT with Larry | KIMARLI FERNANDO - YouTube (29.6.2020)
[65] Sri Lanka : Sri Lanka airports will not be opened until COVID-19 is 100% controlled - Tourism Minister (colombopage.com) (17.9.2020); see also, Airports can be reopened within 12 hours of receiving green light: State Minister D.V. Chanaka (newsfirst.lk) (6.9.2020)
[66] Proposal to bring small tour groups still under discussion: Tourism Minister | Daily FT (27.10.2020)
[67] Proposal to bring small tour groups still under discussion: Tourism Minister | Daily FT (27.10.2020)
[68] Airports can be reopened within 12 hours of receiving green light: State Minister D.V. Chanaka (newsfirst.lk) (6.9.2020)
[69] COVID-19 cases in Minuwangoda cluster tops 1500 (newsfirst.lk) (13.10.2020)
[70] Tourism Minister appoints 11-member Advisory Committee | Daily FT (4.11.2020)
[71] Tourism Minister appoints 11-member Advisory Committee | Daily FT (4.11.2020)
[72] New guidelines in the offing to welcome tourists from 1 Jan. | Daily FT (1.12.2020)
[73] Sri Lanka to welcome tourists from countries which will vaccinate citizens | EconomyNext (4.12.2020)
[74] Sri Lanka re-starts tourism under Covid-19 rules from December 28 | EconomyNext (25.12.2020)
[75] Eureka! First post-COVID tourists set to arrive from Ukraine today | Daily FT (28.12.2020)
[76] Three Ukrainian tourists test positive for COVID-19 in Sri Lanka's tourism revival project | EconomyNext (30.12.2020)
[77] Tourism Chief caught unawares about Ukrainians' jaunts to Mirissa, Yala | Daily FT (4.1.2021)